# සෙල්ලිපි හා සන්නස් වැනි අභිලේඛනවලින් හෙළිවන රාජ්‍යත්ව සංකල්පයේ විකාශනය පිළිබඳ ව අධ්‍යයනයක්

එච්.පී.ඒ.වී.කේ.එම්. කොබ්බෑකඩුව*

මෙතෙක් සිදුකළ පුරාවිද්‍යාත්මක ගවේෂණයන්ට අනුව ලක්දිව ආදිතම සෙල්ලිපි ලෙස දේවානම්පිය තිස්ස රජුගේ යැයි සැලකෙන පිච්චන්දියාව හා කොල්ලදෙණිය යන සෙල්ලිපි හැඳින්වේ. ඉතිහාසය සනාථ කිරීමේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස අභිලේඛන අතර, ක්‍රි. පූ 03 වන සියවසේ සිට 19 වන සියවස දක්වා රචිත සෙල්ලිපි විශේෂ වේ. සෙල්ලිපිවලින් හෙළිවන දේශපාලන, ආර්ථික, සාමාජික, ආගමික හා සංස්කෘතික අංශයන් අතර රාජ්‍යත්වය වැනි දේශපාලනික කරුණු අධ්‍යයනය කිරීම විෂයෙහි ලා සෑම සෙල්ලිපියකින් ම පාහේ ලැබෙන පිටිවහල සුළුපටු නොවේ. රජු විසින් සිය රාජකීය මුද්‍රාවෙන් යුතු ව වරප්‍රසාද සහිත ව හෝ රහිත ව නිකුත් කරන ප්‍රදානයන් වන සන්නස්වලින් ද මෙවන් අංශයන් පිළිබඳ ව හෙළි වේ. දැනට හමු වී ඇති ලක්දිව ආදිතම සන්නස ලෙස හැඳින්වෙන පොළොන්නරු යුගයේ මහා විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නසේ සිට, අවසන් රජු වූ මහනුවර යුගයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වා නිකුත් කළ සන්නස් මෙහි ලා මනා මෙහෙයක් ඉටු කරයි. ලොව අන් සෑම සියලු සංස්ථාවක් මෙන් ම, රාජ්‍යත්වය නම් සංස්ථාව කෙරෙහි වූ සංකල්පය ද මෙරට විකාසනය වූ අන්දම කෙසේ දැයි විමසිය යුතු ය. මුල් ම යුගයේ ගමණි, මපුරුමු, මහරඣ, දෙවනපිය, බුදදස, වැනි සරල උපපද යොදා ගත්ත ද, කල් යත් ම මහරජ, සිරිසංබො, වැනි රාජාභිධාන ද, ඉන්පසු මහාසම්මත මනු රජ කුලය, සූර්ය වංශය හා සහසම්බන්ධ කර ගනිමින් ගෞරව අභිධාන සමග රාජ්‍යත්ව සංකල්පය විකාසනය විය. බෞද්ධ ආභාසයක් ලැබුව ද,චක්‍රවර්ති වැනි විශේෂණ පද හා ආත්මෝත්කර්ෂණ වර්ණනාවලින් යුක්ත වූ මෙම රාජාභිධානයන් විසින් 16,17, 18 සියවස් වන විට රජු ව මහා බලසම්පන්න දෙවියෙකුගේ තත්ත්වයට පත් කරන ලදි. ඒ අනුව රාජ්‍යත්වය නම් සංකල්පය මෙරට විකාසනය වූ අන්දම කෙසේ දැයි විමසීම සඳහා යුගයෙන් යුගය තෝරාගත් සෙල්ලිපි හා සන්නස් අධ්‍යයනය වඩාත් ප්‍රයෝජනවත් වේ.

ප්‍රමුඛ පද - සෙල්ලිපි, රාජ්‍යත්වයේ සංකල්ප, සන්නස්, විකාසනය, අභිධාන

* සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය kobbekaduweanuradha@gmail.com